සුරාබදු කොමසාරිස් ජනරාල්
ஆணையாளர் நாயகம்
Commissioner General
3888022
3888023

අතිරේක සුරාබදු කොමසාරිස් ජනරාල් (ආදායම් ප්‍රතිපත්ති හා පරිපාලන)
மேலதிக ஆணையாளர் நாயகம் (வருமானக் கொளகை, நிர்வாகம்))
Additional Commissioner General (Revenue Policy & Admin)
2877891

අතිරේක සුරාබදු කොමසාරිස් ජනරාල් (ආදායම් මෙහෙයුම් හා නීති ක්‍රියාත්මක කිරීම)
மேலதிக ஆணையாளர் நாயகம் (வருமான முகமைத்துவம், சட்டவலுப்படுத்தல்)
Additional Commissioner General (Revenue Management&Law Enforcement)
2045050

ෆැක්ස් / பெக்ஸ் / Fax: 2877890

ඊ-මේල් / மின்னஞ்சல் / E-Mail: excisen@slt.lk

දුරකථන අංකය / தொலைபேசி எண். / Telephone No: 2045000

# ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
# இலங்கை மதுவரித் திணைக்களம்
# EXCISE DEPARTMENT OF SRI LANKA

අංක 353, කෝට්ටේ පාර. රාජගිරිය. இல.353,கோட்டை வீதி,இராஜகிரிய.No 353, Kotte Road, Rajagiriya.

මගේ අංකය. / எனது இல / My No.: ED/02/06/02/2023

ඔබේ අංකය. / உமது இல: / Your No.:

දිනය / திகதி / Date: 2022.12.28

සහකාර සුරාබදු කොමසාරිස් /සුරාබදු අධිකාරි/සුරාබදු ස්ථානාධිපති මඟින්,

අදාල නිලධාරීන් වෙත

<u>වාර්ෂික ස්ථාන මාරුවීම් අභියාචනා තීරණ - 2023</u>

<u>සුරාබදු සැරයන් මේජර්/ සුරාබදු සැරයන්/ සුරාබදු කෝප්‍රල්/ සුරාබදු නියාමක/ සුරාබදු කාන්තා නියාමක/ සුරාබදු නියාමක රියදුරු</u>

මගේ සමාංක හා 2022.11.28 දිනැති ස්ථාන මාරු මණ්ඩල තීරණ අනුව 2023 වාර්ෂික ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද අභියාචනා සළකා බැලීමෙන් පසුව අභියාචනා මණ්ඩලයේ නිර්දේශයන් මත ලබා ගෙන ඇති තීරණ මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. ඉහත සඳහන් ලිපි වලින් හා මෙම ලිපියෙන් නිවේදනය කරනු ලබන සියලු ස්ථාන මාරුවීම් 2023.01.01 දින සිට ක්‍රියාත්මක කළ යුතු අතර, ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කිරීමේදී සියලුම නිලධාරීන් 2023.01.01 දින නව සේවා ස්ථාන වලට වාර්තා කිරීමට හැකිවන පරිදි දැනට තමන් අයත් ජ්‍යෙෂ්ඨතම නිලධාරියාගේ පූර්ව අනුමැතිය ඇතිව ස්ථාන මාරුවී යාමට ක්‍රියා කළ යුතු ය. නව සේවා ස්ථානයට පිටත්ව යාමට පෙර තමන් භාරයේ ඇති රජයේ බඩු බාහිරාදිය සහ ලිපිලේඛන නිසි පරිදි භාරදිය යුතු ය. අධිකරණ නඩුවලට අදාළ ලියකියවිලි සුදුසු නිලධාරියෙකුට ලිඛිතව භාරදිය යුතු ය.

03. ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක වන දිනෙන් ඔබ්බට කිසිඳු නිලධාරියෙකු සඳහා සේවා ස්ථානයක ප්‍රධානියෙකු විසින් නිවාඩු අනුමත නොකළ යුතු ය. යම් හෙයකින් නව සේවා ස්ථානයට වාර්තා කිරීමට නියමිත දින සිට නිවාඩු අවශ්‍ය වුවහොත් ඒ බව නව සේවා ස්ථානයේ ප්‍රධානියාට දන්වා නිවාඩු ලබා ගත යුතු ය. අසනීප නිවාඩු ලබා ගතහොත් ආසන්න රජයේ රෝහලක වෛද්‍ය නිලධාරියෙකු විසින් නිකුත් කළ වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය. එසේ කිරීමට අපොහොසත් වුවහොත් එම දිනයන් වැටුප් රහිත නිවාඩු සේ සලකා කටයුතු කිරීමට හෝ සේවය අතහැර ගිය අයෙකු සේ සැලකීමට හෝ වෙනත් විනය ක්‍රියා මාර්ගයකට භාජනය කිරීමට සිදු වනු ඇත.

04. නව සේවා ස්ථානවල රාජකාරී සඳහා වාර්තා කළ විගස ඒ බැව් එදිනම සුරාබදු ස්ථානාධිපති, සුරාබදු අධිකාරී සහ සහකාර සුරාබදු කොමසාරිස් මඟින් මා වෙත වාර්තා කිරීම අත්‍යාවශ්‍ය වේ.

05. අදාළ ස්ථානාධිපතිවරුන් තමන් යටතේ සේවය කරනු ලබන ස්ථාන මාරුවීම් ලබා සිටින නිලධාරීන්ට ඔවුන්ගේ ස්ථාන මාරුවීම් නියෝග ලිඛිතව දැන්විය යුතු ය. නිලධාරීන් ස්ථාන මාරු වී යාමට පෙර වරෙන්තුකරුවන් සම්බන්ධ කටයුතු අවසන් කර ගැනීමට ක්‍රියා කළ යුතු ය.

06. නියමිත ස්ථාන වල සේවා කාලය සම්පූර්ණ කළ නිලධාරීන්ට මෙම ස්ථාන මාරුවීම් සඳහා ආයතන සංග්‍රහයේ විධි විධාන පරිදි ගමන් වියදම්, රාජකාරී නිවාඩු හා රාජකාරී දුම්රිය බලපත්‍ර ලබා ගත හැකිය.

07. වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කරන්නේ නම් කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ 23 වන පරිශිෂ්ටය ප්‍රකාරව 2023.01.14 දිනට පෙර මා වෙත එවිය යුතු බව කාරුණිකව දන්වමි.

එම්. ජේ. ගුණසිරි
සුරාබදු කොමසාරිස් ජනරාල්
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
අංක: 353, කෝට්ටේ පාර, රාජගිරිය

එම්.ජේ.ගුණසිරි
සුරාබදු කොමසාරිස් ජනරාල්

පිටපත් :

1. ප්‍රධාන කාර්යාලයේ සියලුම මාණ්ඩලික නිලධාරීන්
2. අදාල වෘත්තීය සමිතිවල ලේකම්වරුන්